**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව**

# ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ග ගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.06.08 දින වේ.

*සටහන 1.-* මාර්ගගතව අයදුම්පත් භාර ගැනීම 2026.05.11 දින පෙ.ව. 09.00 ට ආරම්භ වන අතර, 2026.06.08 දින ප.ව. 09.00 ට අවසන් වේ.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2026 අගෝස්තු මාසයේ දී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය යථා කාලයේ දී දැනුම් දෙනු ඇත. විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතුවේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන්ම මෙම තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාව :*

I. සෑම අයදුම්කරුවකුම ඔහු / ඇය :-

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු බවත්;
(ආ) විශිෂ්ට චරිතයකින් යුතු අයකු බවත්;
(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 35ට නොවැඩි බවත්, සතුටුදායක සාක්ෂිවලින් ඔප්පු කළ යුතු ය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2005.06.08 දින හෝ ඊට පෙර හා 1991.06.08 හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

*සටහන 2 .-* යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

II. ශාරීරික යෝග්‍යතාව:- පිරිමි අයදුම්කරුවකුගේ උස අඩි 5 අඟල් 5 ට අඩු නොවිය යුතු අතර, පපුව (ප්‍රසාරණය කළ විට) අඟල් 33 ට නොඅඩු විය යුතු ය.

අයදුම්කාරියන්ගේ උස අඩි 5 අඟල් 3ට නොඅඩු විය යුතු ය.

III. අධ්‍යාපන සුදුසුකම්: සෑම අයදුම්කරුවකුටම/ අයදුම්කාරියකටම පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතු ය:-

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයක් විසින් පිරිනමනු ලබන වසර තුනකට (03) නොඅඩු අධ්‍යයන කාල සීමාවක් සහිත උපාධියක් ;

*සහ*

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී විෂයයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සම්මාන සාමර්ථයක් ලබා තිබීම. (වෛකල්පික සාමාර්ථ්‍යය අදාළ නොවේ.);

*හෝ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයේදී විෂයයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමර්ථයක් ලබා තිබීම.

*සටහන 3.-* උපාධියකට අදාළ විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින කිසිම අයකුට මෙම විභාගයට පෙනී සිටීමට නොහැක. කෙසේ වුව ද පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වූ අයකුට ඔහු/ඇය එම උපාධි විභාගය සමත් වූ බවට එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිගෙන් ලබා ගත් නිල ලිපියක් ඉදිරිපත් කළ අවස්ථාවක දී මෙම විභාගයට පෙනී සිටීමට අවසර දිය හැකි ය.